# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිඩකරණලදී.

නො. 7,106 — 1920ක්වූ ජූනි මස 4වෙනි දිනවූ සිකුරාද.

# Part IV.—හතරවෙනි කාණ්ඩය.

---

### උපාඩගණිති.

**වර්‍ෂ 1892කේ පණවනලද කුඩානගර පිළිබඳ සනීපාරක්‍ෂක ආඥාපණත.**

වර්‍ෂ 1892කේ නොමමර 18 දරන කුඩානගරවල සනීපාරක්‍ෂක පිළිබඳ ආඥාපණතේ 32වෙනි වගන්තියේ (2) වෙනි උප වගන්තිය යටතේ නුවරඑළි දිස්ත්‍රික්කේ සනීපාරක්‍ෂකසභාව විසින් සාදනලදුව වැඩබලන ගරුතර ආණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව ස්ථිරකරනලද අණපණත්.

උතුමාණන්වහන්සේගේ අණපරිදි,
බී. හෝර්ස්බරෝ,
වැඩබලන මහලේකම්තාරිස් වම්හ.

වර්‍ෂ 1920ක්වූ මැයි මස 28වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

---

**සඳහන්කරනලද අණපණත්.**

**පාරබද්ද.**

1. අවුරුදු 18ටත් 55ටත් අතරේ වයසඇති සියලුම පිරිමින් එක එක අවුරුද්දේ නගරතුළ පාරවල්වල දවස් 6ක් නොකඩව වැඩකළයුතුයි.

2. මෙහි පහත දක්වන අය ඉහතකී නියමලෙස වැඩකිරීමෙන් නිදහස්කරනු ලැබේ, එනම් :—

(*a*) වර්‍ෂ 1861කේ 10වෙනි ආඥාපණතේ 50වෙනි වගන්තිය යටතේ සහ වර්‍ෂ 1910යේ 8වෙනි ආඥාපණතේ 26වෙනි වගන්තියේ (5) වෙනි උපවගන්තිය යටතේ වැඩකිරීමෙන් නිදහස්කරනුලැබූ අයද.

(*b*) ශාරීරික හෝ මානසික ආබාධයකින් හෝ වෙනයම් කාරණයක් නිසා වැඩකරන්ට නුපුළුවන්යයි සභාවට හැඟී යන අයද.

3. වැඩකිරීම වෙනුවට වැඩකරන්ට බැඳී සිටින්නාවූ යම් කෙනෙකුට මාර්තු මස 31වෙනි දිනට ප්‍රථම අවුරුද්දකට රුපියල් 2ක් නීතිප්‍රකාර ගෙවිය හැකිය.

4. යම්කෙනෙක් ඔහුට දැනුම්දුන්නාට පසු වැඩනොකළොත් එක්කෝ, ඒ වෙනුවට මුදල් නොගෙව්වොත් මැයි මස 31වෙනි දිනට ප්‍රථම දෙළොස් දවසක් වැඩකිරීමට හෝ රුපියල් 4ක් ගෙවීමට හෝ යටත්විය යුතුයි. පාරබද්ද නොගෙවූ අයට විරුඬව මෙම ආඥාපණතේ 33වෙනි කාණ්ඩයෙන් සභාපතිතුමාට පවරණලද බලයපිට එතුමා විසින් ක්‍රියාකරනු ලැබේ.

5. මේ බද්ද බෝඞ් සභාව විසින් පත්කරන බදු අයකරන්නෙක් නොහොත් අයකරන්නන් විසින් එකතුකරනු ලැබේ.

6. වැඩකිරීම හෝ බදු ගෙවීම සම්බන්ධ සියලුම දැන්වීම් ලියවිල්ලකින් හෝ අණබෙරයකින් හෝ කරනු ලැබේ.

---

### ඉඩම් විකිණීම්.

**No. 2,560, C. P.**—මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1920ක්වූ ජූලි මස 26වෙනි දිනවූ සඳුදින පස්වරු 1.30ට මහනුවර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ උඩපලාත කොඩ්ඩාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 1ක්.

සිතියම 6,426. ගම—ගඟඉහලකෝරලේ අම්බලන්පිටිය. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත; අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
| --- | --- | --- | --- | --- | --- |
| 1584 | අඟුරුගේම්බදෙනිය .. | කේ. ඇම්. කිරිබන්ඩා උලපනේ ආරච්චි .. | කැලය .. | 1 1 29 | 100 |

මෙම ඉඩම සම්බන්ධව වැඩිදුර කාරණා මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, පලාතේ තොරතුරු සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද දැනගන්ට පුළුවන.

බී. හෝර්ස්බරෝ,
වැඩබලන මහලේකම්තාරිස් වම්හ.

වර්‍ෂ 1920ක්වූ මැයි මස 29වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

**No. 3,666, S. P.**—දකුණු දිසාවේ මහා ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1920ක්වූ ජූලි මස 13වෙනි දිනවූ අඟහරුවාදා පස්වරු 1ට ගාල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ ගාළු පලාතේ බෙන්තර වලල්ලාවිටිකෝරලේ කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 5ක්.

සිතියම 11,455. ගම—කදිරන්දෙල. අයිතිකමකියන්නා—රජසන්තක.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | නරවැල්කැටියේකැලේ .. | බෝගහගොඩවත්තේ පදිංචි ඇස්. ඕ. සිරිමාන්න | සුළුබැද්ද .. | 5 | 0 | 39 | 62·50 |
| 2 | එම .. | එම .. | සුළුබැද්ද (විකිනීමටනොවේ) | 0 | 1 | 8 | —* |
| 3 | එම .. | එම .. | එම .. | 0 | 0 | 26 | —* |
| | | ගම—පිටුවල. | | | | | |
| 4 | නරවැල්කැටියේමානාන නොහොත් නරවැල්කැටියේඹිවිට | එම .. | එලිකරපුඉඩම (විකිනීමට නොවේ) | 1 | 0 | 19 | —* |
| 5 | එම .. | එම .. | එලිකරපු ඉඩම .. | 0 | 0 | 19 | 60 |
| 6 | නරවැල්කැටියේඹිවිට .. | එම .. | එම .. | 1 | 0 | 13 | 60 |
| | | අයිතිකමකියන්නා—කේ. ඩබ්ලිව්. සියදෝරිස්. | | | | | |
| 7 | එම .. | බෝගහගොඩවත්තේ පදිංචි ඇස්. ඕ. සිරිමාන්න | වත්ත .. | 1 | 0 | 16 | 60 |
| | | | වැවිල්ල .. | | | | 10 |
| | | අයිතිකමකියන්නා—රජසන්තක. | | | | | |
| 8 | නරවැල්කැටියේමානාන .. | බෝගහගොඩවත්තේ පදිංචි ඇස්. ඕ. සිරිමාන්න | එලිකරපු ඉඩම .. | 1 | 0 | 16 | 60 |

* තහනම් ඉඩම්.

මෙම ඉඩම් ගැණ වැඩිදුර කරුණු ගාල්ලේ මහා ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වෙයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගන්ට පුළුවන.

වර්‍ෂ 1920ක්වූ මැයි මස 27වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

බී. හෝර්ස්බරෝ,
වැඩබලන මහලේකම්තාරිස් වම්හ.

---

**No. 3,667, S. P.**—දකුනු දිසාවේ මහා ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් විකිණීම් නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1920ක්වූ ජූලි මස 22වෙනි දිනවූ බෘහස්පතින්දා පස්වරු 1ට ගාල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ ගාළු පලාතේ බෙන්තොට වලල්ලාවිටිකෝරලේ කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 5ක්.

සිතියම 11,273. ගම—යටගල. අයිතිකමකියන්නා—රජසන්තක.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. මහත, | අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 2 | දොරණගහගොඩැල්ල නොහොත් අඹිබලමලග ගොඩැල්ල .. | වල්ඉඟුරුකැටියේ ඒ. එච්. සෙදෙරිස් .. | පතන .. | 1 | 0 | 10 | 30* |
| | | සිතියම 11,321. ගම—කුඩාඋඟුරුගහ. | | | | | |
| 2 | කජුගහදූවේකැලේ .. | සී. වී. ද සිල්වා සහ ඩී. එච්. කරෝලිස් සිල්වා වල්ඉඟුරුකැටිය .. | බැද්ද .. | 0 | 2 | 18 | 65 |
| | | සිතියම 11,450. ගම—නැවදගල. අයිතිකමක්යන්නා—පී. ඒ. ජූලියන්. | | | | | |
| 1 | කන්දඅද්දරවත්ත .. | පොන්නම්පෙරුමආරච්චිගේ ජූලියන් .. | වත්ත .. | 1 | 0 | 7 | 100 |
| | | | වැවිල්ල .. | — | | | 2·90 |
| | | අයිතිකමකියන්නා—රජසන්තක. | | | | | |
| 2 | එම .. | පොන්නම්පෙරුමආරච්චිගේ ජූලියන් .. | අල්ලපු ඉඩමේ කැබැල්ල (විකුනන්නේනැහැ) | 0 | 0 | 8 | —† |
| 3 | ඇඹිබරල්ලාගහමානාන .. | එම .. | පතන (විකිනීමට නොවේ) | 0 | 0 | 22 | —† |
| 4 | එම .. | කොළඹ රෙස්මිස්පලේස්, ඊ. සී. ද පොන්සේකා | පතන .. | 1 | 0 | 5 | 100 |
| | | අයිතිකමකියන්නා—පානේගම පදිංචි හල්ජෝති චාර්ලිස්ද සිල්වා. | | | | | |
| 5 | ඇඹිබරල්ලාගහවත්ත .. | කොළඹ රෙස්මිස්පලේස්, ඊ. සී. ද පොන්සේකා | රබර් ඉඩම .. | 0 | 0 | 8 | 100 |
| | | | වැවිල්ල .. | — | | | 0·50 |

* මිනිරන් හෑරීමේ බලය ඇතුව අක්කරයක් රු. 250යි. † තහනම් ඉඩම්.

මෙම ඉඩම් ගැණ වැඩිදුර කාරණ ගාල්ලේ මහ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වෙයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගන්ට පුළුවන.

වර්‍ෂ 1920ක්වූ මැයි මස 27වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

බී. හෝර්ස්බරෝ,
වැඩබලන මහලේකම්තාරිස් වම්හ.

**No. 3,668, S. P.**—හම්බන්තොට දිසාවේ ආණ්ඩුවේ උපජ්ජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් විකිනීම් නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1920ක්වූ ජූලි මස 19වෙනි දිනවූ සඳුදා උදේ 10ට හම්බන්තොට කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ හම්බන්තොට පලාතේ මාගම්පත්තු කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 28ක්.

සිතියම 11,237. ගම—යෝදකන්ඩිය. අයිතිකමකියන්නා—රජසන්තක.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | යෝදකන්ඩියේගොඩකැල්ල .. | ජී. කේ. ජේ. ද සිල්වා .. | කැලේ .. .. | 2 | 3 | 39 | 30 |

සිතියම 11,239. ගම—යෝදකන්ඩිය.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 3 | බිසෝකොටුවේවම්බුවේඉඩම .. | — .. | විකිනීමට නොවේ, ඇලට ඉතුරු කරපු බිම | 0 | 3 | 36 | —* |
| 4 | එම .. | — .. | එම එම .. | 1 | 2 | 27 | —* |
| 5 | බිසෝකොටුවේවම්බුවේගොඩාන | ඈස්. පී. කොඩිප්පිලි .. | කැලේ .. .. | 0 | 3 | 10 | 30 |
| 6 | බිසෝකොටුවේවම්බුවේදෙනිය .. | එම .. | දෙනිය .. .. | 0 | 1 | 7 | 30 |
| 7 | විහාරගොඩ නොහොත් වෙහෙර ගොඩැල්ල | ඩී. ඩී. පලිහක්කාර .. | හේන .. .. | 2 | 0 | 33 | 20 |
| 8 | එම .. | — .. | හේන, පාරට ඉතුරුකරපු බිම.. | 0 | 2 | 23 | —* |
| 9 | නාගම්හවිහාරපොකුන නොහොත් වෙහෙරගොඩැල්ල පොකුන සහ වෙහෙරගොඩ නොහොත් වෙහෙරගොඩැල්ල | — .. | පොකුන සහ ඒට ඉතුරුකරපු හරිය | 0 | 1 | 14 | —* |
| 10 | විහාරගොඩ නොහොත් වෙහෙර ගොඩැල්ල සහ බිසෝකොටු බස්නාව | — .. | බිසෝකොටුවේ ඇලට ඉතුරුකර කරපු හරිය | 1 | 1 | 6 | —* |

සිතියම 11,256. ගම—දෙබරවැව.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | තිහවබැද්ද .. | — .. | මූර්තියම්මා ඇලට ඉතුරුකරපු හරිය | 0 | 0 | 26 | —* |
| 2 | එම .. | — .. | කැලේ .. .. | 0 | 0 | 38 | 25 |
| 3 | එම .. | — .. | මූර්තියම්මා ඇලට ඉතුරුකරපු හරිය | 0 | 3 | 9 | —* |
| 4 | එම .. | කේ. අන්ද්‍රිස්හාමි .. | කැලේ .. .. | 3 | 0 | 35 | 25 |
| 5 | එම .. | — .. | පාරට ඉතුරුකරපු හරිය .. | 1 | 0 | 35 | —* |
| 6 | එම .. | — .. | මූතියම්මවල ඇලට ඉතුරකරපු හරිය | 1 | 1 | 15 | —* |
| 7 | එම .. | — .. | යාමර්ම්වලට ඉතුරුකරපු හරිය | 0 | 2 | 23 | —* |
| 9 | එම .. | — .. | කැලේ .. .. | 1 | 0 | 0 | 25 |
| 10 | එම .. | — .. | එම .. .. | 0 | 2 | 5 | 30 |
| 11 | එම .. | — .. | කැලේ, පාරට ඉතුරුකරපු හරිය | 0 | 3 | 7 | —* |
| 12 | එම .. | — .. | කැලේ, ඇලට ඉතුරුකරපු හරිය | 0 | 1 | 18 | —* |
| 13 | එම .. | — .. | එම .. .. | 1 | 2 | 6 | —* |
| 14 | එම .. | ඩබ්ලිව්. පී. අන්ද්‍රිස්හාමි .. | කැලේ .. .. | 1 | 3 | 24 | 30 |
| 16 | මොහන්දිරම්කුඹුර .. | අයි.ඇල්.ඇම්. යූසුප් මොහන් දිරම්තුමා විසින් | කුඹුර .. .. | 0 | 2 | 15 | 100 |

සිතියම 11,463. ගම—යෝදකන්ඩිය.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | යෝදකන්ඩියගොඩාන .. | ඩී. ඩී. අලහකෝන් .. | හේන .. .. | 0 | 3 | 37 | 30 |
| 2 | එම .. | — .. | පාරට ඉතුරුකරපු හරිය .. | 0 | 1 | 5 | —* |
| 3 | එම .. | ඩී.ඩී. අලහකෝන් සහ ඩබ්ලිව්. එච්. මෙන්දියස්අප්පු | හේන .. .. | 0 | 3 | 38 | 30 |
| 4 | එම .. | — .. | රජසන්තක ඉඩම්වලට යාමර්ම් වලට ඉතුරුකරපු හරිය | 0 | 0 | 37 | —* |

අවසාන සිතියම 54. ගම—මිරිජ්ජවල.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1F | මිරිජ්ජවලකැලේයාය .. | ජේ. ඩී. වික්‍රමනායක .. | කැලේ .. .. | 9 | 3 | 31 | 16 |

* විකිනීමට නොවේ.

මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු හම්බන්තොට ආණ්ඩුවේ උපජ්ජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද දැනගන්ට පුළුවන.

වර්ෂ 1920ක්වූ මැයි මස 29වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදිය.

බී. හෝර්ස්බරෝ,
වැඩබලන මහලේකම්තාරිස් වහන්සේ.

---

**No. 1,018, P. of S.**—සබරගමු දිසාවේ රත්නපුරේ මහජ්ජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1920ක්වූ ජූලි මස 19වෙනි දිනවූ සඳුදා පස්වරු 1ට රත්නපුර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුර දිස්ත්‍රික්කේ කොට්ඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 10ක්.

සිතියම 21. ගම—නොරගල්ල, නවදුන්කෝරළේ. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත. අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 5 | ආනගලහේන කහටගහ හේනහතරහවුලේහේන | ලංකා (පාරා) රබර් සමාගම .. | ලන්ද .. | 40 | 2 | 13 | 66* |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| | **සිතියම 2,647. ගම—තෙපුලන්ගොඩ, කුරුවිටිකෝරලේ.** | | | | |
| 1 | මහවලරබර්වත්ත නොහොත් ඉඹුලගාවහේන | සීමාසහිත මහවල තේ සහ රබර් සමාගම විසින් ආණ්ඩුවෙන් අල්ලාගත්කැබෙල්ල | අවුරුදු 14ක් පමණවූ රබර් | 0 0 9 | 1006 |
| 2 | ඉඹුලගාවහේන .. | දිනෙන්සුවා සහ තවත් දෙදෙනෙක් .. | ලන්ද .. | 6 2 35 | 56 |
| | **සිතියම 26. ගම—කිරිබත්ගල, නවදුන්කෝරලේ.** | | | | |
| 29Q | මහකුඹුරගාවාවත්ත .. | කේ. ජී. පුංචිමහත්මයා විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් කැබෙල්ල | වත්ත .. | 1 1 25 | 131 |
| | **සිතියම 2,642. ගම—බඹරබොටුව මහබාගෙ, නවදුන්කෝරලේ. අයිතිකමකියන්නා—ඒ. බී. කිරිනසිංදෙ.** | | | | |
| 1 | බන්ඩාරවත්ත .. | ඒ. බී. කිරිනසිංදෙ විසින් උරුමකියනුලැබේ | පොල්වත්ත .. | 0 1 30 | —† |
| | **අයිතිකමකියන්නා—ආණ්ඩුව.** | | | | |
| 2 | බන්ඩාරවත්තෙඹිවිට .. | ඒ. බී. කිරිනසිංදෙ සහ තවත් කෙනෙක් විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් කැබෙල්ල | ඔිවිට .. | 0 2 7 | 56 |
| 2A | එම .. | — .. .. | ඔිවිට, මල්පොල දෙල ආරක්ෂකබිම්කැබෙල්ල | 0 2 7 | —‡ |
| | **සිතියම 2,643. ගම—බඹරබොටුව කුඩාබාගෙ, නවදුන්කෝරලේ.** | | | | |
| 2 | බටහේන නොහොත් සිල්වාලැන්ඩිවත්ත | ඇන්. ඩී. ඇස්. සිල්වා මහතා විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් කැබෙල්ල | අවුරුදු 5 සිට 9 දක්වා වයසැති තේ සහ රබර් තිබේ | 3 3 31 | 1006 |
| 3 | එම .. | එම .. .. | එම .. | 3 2 32 | 1006 |
| 3A | එම .. | — .. .. | අවුරුදු 10ක් පමණ වයසැති රබර් තිබෙන වත්ත, පිල්ලේදෙල ආරක්ෂකබිම්කැබෙල්ල | 0 3 18 | —‡ |
| 4 | බටහේන .. | හෙන්ද්‍රික් අප්පුහාමි විසින් ආණ්ඩුවෙන් අල්ලාගත්කැබෙල්ල | ලන්ද .. | 2 1 28 | 51 |
| 4A | බටහේන නොහොත් පිල්ලදෙලහේන | — .. .. | අවුරුදු 2½ක් පමණ වයසැති රබර්, බඹරබොටුඔය සහ පිල්ලදෙල ආරක්ෂකබිම්කැබෙල්ල | 1 2 34 | —‡ |
| 5 | බටහේන .. | හෙන්ද්‍රික්අප්පුහාමි විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් කැබෙල්ල | ලන්ද .. | 1 0 37 | 51 |
| 5A | එම .. | — .. .. | ලන්ද, බඹරබොටු ඔය ආරක්ෂකබිම්කැබෙල්ල | 0 3 22 | —‡ |

* මෙම ඉඩම් කැබෙල්ල ඉඩම් විකුණුම්කරණ අළුත් නියෝගවල නොම්මර 35හේ වගන්තියේ ප්‍රකාර, සීමා සහිත ලංකා (පාරා) රබර් සමාගමට, වෙන්දේසිනොකර තක්සේරුමිලට විකුණනුලැබේ.

† මෙම ඉඩම්කැබෙල්ලට උරුමකියාහිටින අමුවලබඩල්ගේ කිරිනසිංදේට ආණ්ඩුවෙන් නිදහස්පත්‍රයක් දෙනුලැබේ.

‡ විකුණනු නොලැබේ.

මෙම ඉඩම් සම්බන්ධ වැඩිදුර කාරණ සබරගමු පලාතේ රත්නපුරේ ආණ්ඩුවේ මහේජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගන්ට පුළුවන.

වර්‍ෂ 1920ක්වූ ජූනි මස 1වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

බී. හෝර්ස්බරෝ,
වැඩබලන මහලේකම්තාරිස් වම්හ.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැණීම සම්බන්ධ දැන්වීම.

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3හේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—පේරාදෙනියේ සිට ගම්පලට යන පාර වෙනඅතකට හැරවීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

**සිතියමේ නො. 7,020. ගම—ගම්පලපාර.**

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කලුවාවහල්හකඩකෝපිවත්තේහේන .. | හිස් ඉඩම .. | ජේ. ආර්. පී. ඇස්. සිල්වා .. | 0 0 7·1 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1920ක්වූ ජූලි මස 9වෙනි දින පස්වරු 2හේ කනිසමට මහනුවර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1920ක්වූ ජූනි මස 4වෙනි දින මහනුවර කච්චේරියේදීය.

සී. ඇස්. වෝන්,
ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

## මුඩුඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම.

[කුරුණෑගල දැන්වීම නො. 7,555.]

වර්ෂ 1920ක්වූ ජූනි මස 4වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩි ගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් එම අය විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900 සහ 1903න් ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන් නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී එච්. සී. වෙලර් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඊට ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වාසිටින්ට නොයෙදුනොත්, එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙනහැර දක්වන්ට නොයෙදුන සෑම ඉඩම් රජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

එච්. සී. වෙලර්,
විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

මෙකී ඉඩම්වල නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට සිඅතිකම්කීම හැටියට බාරගණු ලැබේ.

### ඉඩම්වල තොරතුරු.

වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ දේවමැදිහත්පත්තුවේ ගිරතලානේකෝරළේ මාඩිගේ පන්දුව යන ගම පිහිටා තිබෙන මිට අමුනාපු සිතියම්වල* පෙනීයන මෙහි පහත දක්වන බිම්කට්ටි, එනම් :—

I.—ලංකාමැනීමේ මුල් සිතියම 1,726.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 62A | අළුත්වෙලේහේන | 0 0 16 |

මීට මායිම්—උතුරට ආණ්ඩුව විසින් අයිතිකම්කියන මඩිගේපන්දුවහේන්යායද; නැගෙණහිරට දිග්ගලගෙදර සිට හලාවතට යන පාරද; දකුණට ආණ්ඩුව විසින් විකුණපු අළුත්වෙලේහේනද; බස්නාහිරට ආණ්ඩුව විසින් අයිතිකම්කියන මඩිගේපන්දුවහේන්යායද.

II.—ලංකාමැනීමේ මුල් සිතියම 1,726.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 64A | හැලඹගහහේන | 0 0 5 |
| 64B | එම | 0 0 22 |
| | | 0 0 27 |

මීට මායිම්—උතුරට, නැගෙණහිරට, දකුණට සහ බස්නාහිරට ලේකම්ලාගේ පව්චිරලෙබ්බේ සහ තවත් අය විසින් අයිතිකම්කියන හැලඹගහහේනද.

* ඉංග්‍රිසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 753—754වෙනි පිටුවල ප්ලෑන් බලනු.

[කුරුණෑගල වි: ම. 32—1920.]

---

## ඉල්ලුම්පත්‍ර සඳහා කරණලද දැන්වීම.

මෙහි පහත සඳහන්වන දකුණු දිසාවේ තොටුපල් රේන්ද වර්ෂ 1920ක්වූ ඔක්තෝබර් මස 1වෙනි දින පටන් වර්ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 30වෙනි දින දක්වා ආණ්ඩුවෙන් බදුගැණීමට එවනලද මුද්‍රලත් ඉල්ලුම්පත්‍ර දකුණු දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් භාරගනු ලැබේ.

2. මතුකී මුද්‍රලත් ඉල්ලුම්පත්‍ර මතුපිට හෙවත් ඇන්විලොප් උඩ Tender for Toll Rents "තොටුපල් රේන්ද සඳහා ඉල්ලුම්පත්‍ර" යන වාසගම ඇතුව වර්ෂ 1920ක්වූ ජූනි මස 25වෙනි සිකුරාදා පස්වරු 2ක වනතුරු ගාල්ලේ කච්චේරියේදී භාරගනු ලැබේ. එවිට ඒවායේ මුද්‍ර කඩාබලනවා ඇත. තවද ඉල්ලුම්පත්‍ර දීසිටින සෑමදෙනාම ඉදිරිපිටට ඇවිත් නැතහොත් තමන් විසින් වෙන අයෙකුටනිසි බලයක්දී ඔහු එවා හෝ ඒ දෙනලද ඉල්ලුම්පත්‍ර සැබෑවූ ඇත්තේ ඒවා බවට ඒජන්ත උන්නාන්සේට ඒත්තුගන්වන්ට ඕනෑය.

සතුටුදායක ඉල්ළුම්පත්‍රයක් ලැබුනේ නැත්නම් යම් ඉල්ලුම් පත්‍රයක් හෝ සියලුම ඉල්ලුම්පත්‍ර නිෂ්ප්‍රභාකිරීමේ අයිතිවාසිකම් ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේට තබාගන්නාලදී.

තවද සතුටුදායක ඉල්ලුම්පත්‍රයක් නොලැබුනොත් මේ තොටුපල් රේන්දය එදිනම ප්‍රසිඞ වෙන්දේසියේ විකුණනු ලැබේ.

3. ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් උතුමාණන් වහන්සේ වෙත ඔප්පුකර සිටීමට තෝරාගන්නාලද ඉල්ලුම් පත්‍රය අයිතිකාරයා විසින් ඉල්ලාපු ගණනෙන් දහයෙන් කොටසකට වැටහෙන මුදල් ගණන සල්ලිවලින් වහාම ඇප තබන්ට ඕනෑවා පමණකුත් නොව එම ඉල්ලීම උතුමාණන්වහන්සේ විසින් භාරගන්නට යෙදුනිනම්, ඔහුගේ ඉල්ලීම උතුමාණන් වහන්සේ විසින් ඒත්තුගත් බව දැනුම්දුන් දින පටන් 30 දවස කදී එම ඉල්ලූ ගණනෙන් දෙකෙන් පංගුවකට ඇප මුදලෙන් හෝ තිබා සම්පූර්ණකරන්ට ඕනෑය. තවද ඇප ඔප්පු සම්පූර්ණ කරනතුරු මාසෙක බදු මුදල අත්පිට බදින්ට ඕනෑය.

4. මුදලෙන් ඇප සම්පූර්ණ කරනවානම් විකිණීම දවසේ ඇපේට තබන්ට යෙදුන දහයෙන් කොටසට වැටහෙන මුදල අවුරුද්දේ අන්තිම භාරමාසෙට ගෙවියයුතු මුදලෙන් කොටසක් හැටියට භාරගනු ලැබේ. වටිනා ඇප ඒත්තුගත් මුද්‍ර ඔප්පුවලින් සම්පූර්ණකරනවානම් ඉහතකී දහයෙන් කොටසක් රේන්දේ මුදල් ප්‍රවේසමට ඒජන්ත උන්නාන්සේ විසින් තබාගන්නට යෙදෙනවා ඇත.

5. ඇප පිණිස තබනලද ඔප්පු සෝදිසිකිරීම සඳහා ආණ්ඩුවේ අද්වකාත් උන්නාන්සේට ගෙවියයුතු ගාස්තුවද, ඉඩම් තක්සේරුකිරීමට සහ ඇප ඔප්පු රිජිස්තර්කිරීමට ගෙවිය යුතු ගාස්තුත් ඔහු විසින් ගෙවන්නට ඕනෑය.

6. ගැණුම්කාරයා විසින් රේන්දපලේ පාරේ දෙපැත්තේ යාර 100ක් දුර පෙනෙන රතු එළි දෙකක් තබන්ට ඕනෑය.

7. ඇප වෙනුවෙන් තිබනලද ඉඩම්වල ඔප්පු ඒවා මීට ප්‍රථම ඇපේකට නොහොත් උකසකට යටත්නැති බවට ඉඩම් ලියාපදිංචිකරණ රිජිස්ත්‍රාර්තැනගෙන් සහතිකපත්‍රයක් ලබාගත යුතුයි. මෙම සහතිකපත්‍රය ලබාගැණීමට ඕනෑකරණ වියදම් ඇප තබන අය විසින් දැරිය යුතුයි.

මේ ගැන වැඩිදුර කාරණා ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් ඉල්ලුම්කළවිට දැනගන්ට පුළුවන.

ආණ්ඩුවේ තොටුපල රේන්දය, ගාල්ල දිස්ත්‍රික්කේ:

හල්පාතොට තොටුපල රේන්දය.

ආර්. බී. හැලිංස්,
ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ.

වර්ෂ 1920ක්වූ මැයි මස 28වෙනි
දින ගාල්ලේ කච්චේරියේදීය.

---

පුත්තලමේ බස්නාහිර ඩිපෝ එකේ අඩක 24 දරණ ලුණු ස්ටෝරුව අළුත්වැඩියාකිරීම සම්බන්ධව ඉල්ලුම්පත්‍ර භාරගනු ලැබේ.

2. ඉල්ලුම්පත්‍ර සීල්කර වසනලද ලියුම් කවරයක්තුළ දමා එවන්ට ඕනෑය. එම ලියුම් කවරේ උඩ වම්පැත්තේ කොනේ මින් පහත සඳහන් වචන ලියා තියෙන්ට ඕනෑය. "පුත්තලමේ බස්නාහිර ඩිපෝඑකේ අඩක 24 දරන ලුණු ස්ටෝරු අළුත්වැඩියාකිරීම පිණිස ඉල්ලුම්පත්‍රයයි" තවද මෙකී ඉල්ලුම්පත්‍රය වර්ෂ 1920ක්වූ ජූනි මස 14වෙනි දින පස්වරු එකේ කනිසමට පෙර පුත්තලමේ උප ඒජන්ත උන්නාන්සේට ලැබීමට එවිය යුතුය.

3. ඉල්ලුම්පත්‍රයක් දමන්ට අදහස්කරණ තැනැත්තා ඉල්ලුම්පත්‍රය එවන්ට ප්‍රථමයෙන් කොයිම කච්චේරියකහරි "ටැන්ඩර් පෝර්ම්ස්" යන ගණන පිට රුපියල් 10ක් බඳින්ට ඕනෑය. එසේ බැඳ ලබාගත් රිසිට්එක ඉල්ලුම්පත්‍රයට යාකර එවන්ට ඕනෑය.

4. ඉල්ලුම්කාරයෙකුගේ ඉල්ලුම්පත්‍රය භාරගත් කල්හි එම ඉල්ලුම්කාරයා සතුටුදායක අන්දමකට භාරගත් වැඩේ කර දෙනවාය කියා උප ඒජන්ත උන්නාන්සේ සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙන පිණිස මෙම මුදල ඇපයක් වශයෙන් තබාගන්ට යෙදේ. ඉල්ලුම්පත්‍රය භාරගත්තායින් පසු සෑහෙන කාලයක් ඇතුළත මෙකී කොන්ත්‍රාත්තුවට ඉල්ලුම්කාරයා බැඳෙන්ට නොයදුනොත්, එකී මුදල රජසන්තක කරණු ලැබේ.

5. ඉල්ලුම්කාරයාට පුත්තලමේදී ලියුම් භාරදෙන්ට හෝ තබාතිබීමට ඇඩ්රැස්එකක් සඳහන්කරන්ට ඕනෑය.

6. කොන්ත්‍රාත්තුවට බැඳී සුමාන හතරක් ඇතුළතදී වැඩේ කර ඉවරකරන්ට ඕනෑය.

7. වැඩිදුර කාරණා පුත්තලමේ ලුණු ඉන්ස්පැක්ටර් මහතාගෙන් දැනගන්ට පුළුවන.

කරන්ට තිබෙන වැඩවල විස්තර.

ගොඩනැගිල්ලේ දැනට තිබෙන දිරච්ච හෝ වෙනයම් අන්දමකින් නරක්වී තිබෙන පොල්අතු ලීදඬු ආදිය සහ අනිත් ද්‍රව්‍ය අහක්කර ඒවා වෙනුවට අළුත් සහ සවිඇති ඒවා දමන්ට ඕනෑය.

ස්ටෝරුවේ වහල අළුත් පොල්අතුවලින් සෙවිලිකර ඒවා උඩින් බර වෙනුවට පුවිටු තැබීමද.

ස්ටෝරුවල බිත්ති උවමනාතැන්වල පමණක් අළුත්වැඩියා කළයුතුයි. බිමට පස්දමා සමතලාකර උවමනාතැන් තැලීමද. ස්ටෝරුවල ඇතුළ අළුත් පොල්අතුවලින් අඳුරන්ට ඕනෑය. බිත්තිවල පිටතට නෙරා තිබෙන තැන්වල පරණ පොල්අතු අහක්කර ඒවා කෙලින්කිරීමත්ය.

ඇස්. ඇම්. පී. වැන්ඩර්කෝන්,
උප ඒජන්ත උන්නාන්සේ වෙනුවට.

වර්ෂ 1920ක්වූ මැස් මස 28වෙනි
දින පුත්තලම් කච්චේරියේදීය.

---

(317වෙනි පිට හා සම්බන්ධයි.)

ගම්සභාවල සිවිල් නඩු විසඳීමේ ක්‍රමය සම්බන්ධව වර්ෂ 1906ක්වූ අගෝස්තු මස 3වෙනි දින දරණ ආණ්ඩුවේ ගැසැට් පත්‍රයේ ප්‍රසිඩකරනලද එම දූතම දරණ අණපණත්වල 16වෙනි අණපණත වෙනුවට යෙදීම පිණිස වර්ෂ 1889යේ ගම්සභා ආඥාපණතේ 50වෙනි කාණ්ඩය යටතේ කාරක මන්ත්‍රීසභාවේ සම්මතය ඇතුව වැඩබලන ගරුතර ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් සාදනලද 16වෙනි ආඥාපණත.

උතුමාණන්වහන්සේගේ අණපරිදි,
බී. හෝර්ස්බරෝ,
වැඩබලන මහසෙක්‍රතාරිස් වම්හ.

වර්ෂ 1920ක්වූ මැයි මස 28වෙනි දින කොළඹ
මහසෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

16වෙනි අණපණත.—නොපැමිණීම ගැන කරනලද යම් නියමයකට විරුඩව ඇපැල්ගන්ට නොහැක්කේය; නුමුත් නොපැමිණීම ගැන යම් කෙනෙකුට විරුඩව නියමයක්කරන්ට යෙදුනේනම් එකී අය ඒ නියමය කළාටපසු සෑහෙණ කාලයක් ඇතුළතදී තමාට තිසි කාලයට පැමිණෙන්ට බැරිවුනේ හදිසියක් නොහොත් විපත්තියක් නිසාය නොහොත් විභාගය ගැන සෑහෙන කාරණා දැනගන්ට නොලැබුන නිසා බවද නඩුවේ කාරණාව ගැන තමාට හොඳ වැදගත් වාසියක් තිබෙන බවද සභාපතිතැන ඉදිරිපිටට පැමිණ ඔහුට ඒත්තුගනලෙස පෙන්වාසිටියොත් එවිට සභාපතිතැන විසින් පමුණුවන්ට යුතුය සහ හරිය කියා තමන්ට කල්පනාවෙන නියමවල් සහ කොන්දේසිපිට එකී නියමය නිෂ්ප්‍රභාකොට නොපැමිණීම ගැන නියමය කරන්ට යෙදුන තැන සිට නඩුවේ වැඩ කරගන යාමට නියමකළයුතු වන්නේය. තවද මෙසේ කරන්නේ අනිත් පක්ෂයට දුක්විමක් කළාට පසුවය.

නඩු නියමය නිෂ්ප්‍රභාකරන නොහොත් නිෂ්ප්‍රභාකරන්ට බැරිය කියන ආඥාව සමග එය කරන්ට යෙදුනේ මොන කාරණා නිසාද යන බව සඳහන්වූ නඩු තීන්දුවක්ද තිබෙන්ට ඕනෑය. තවද ඒට විරුඩව ඇපල්ගන්ට පුළුවන.

---

H B. COTTLE, ACTING GOVERNMENT PRINTER, COLOMBO, CEYLON.